# පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම

**කිසියම් කර්මාන්තයකින් හෝ ක්‍රියාකාරකමකින් පරිසරයට සිදු විය හැකි අහිතකර බලපෑම් අවම කිරීමට පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගෙන, ඒ යටතේ පමණක් එම ක්‍රියාකාරකම් කළ යුතු බව ජාතික පාරිසරික පනතේ නියමයක් ඇත.**

## පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගන්නේ කෙසේ ද?

- ඔබගේ කර්මාන්තය හෝ ක්‍රියාකාරකම සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නම්, සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරටු කාර්යාලයෙන් ඉල්ලුම් පත්‍රයක් ලබා ගෙන නිවැරදි ව සම්පූර්ණ කරන්න

- සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය, අදාළ ඇමුණුම් සහ පෙරසැරි ගාස්තුව පෙරටු කාර්යාලයට භාර දෙන්න

  ඔබ විසින් ගෙවූ මුදලට ලදුපතක් සහ පසු විපරම් අංකයක් පෙරටු කාර්යාලයෙන් ඔබට ලබා දේ.

- ඔබගේ ඉල්ලුම් පත්‍රය ඒ අවස්ථාවේ දී ම, පරිසර විෂය භාර නිලධාරියාට යොමු කරනු ඇත

  පරිසර විෂය භාර නිලධාරී විසින් ඔබගේ ඉල්ලීම පරීක්ෂණ කමිටුවට ඉදිරිපත් කිරීමෙන් පසුව ක්ෂේත්‍ර පරීක්ෂණය සඳහා පැමිණෙන දිනය හා වේලාව ඔබට දැනුම් දෙනු ඇත

- ඉල්ලුම් පත්‍රය ලැබී දින හතක් ඇතුළත ක්ෂේත්‍ර පරීක්ෂාව කර පරීක්ෂණ කමිටුවේ නිරීක්ෂණ හා නිර්දේශ නාගරික කොමසාරිස් / ලේකම් වෙත යොමු කරනු ඇත

- විෂය භාර නිලධාරී විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රය සකස් කර නගරාධිපතිගේ / සභාපතිගේ අත්සනට ඉදිරිපත් කරනු ඇත

- සකස් කළ පරිසර ආරක්ෂණ බලපත්‍රයට නගරාධිපති / සභාපති විසින් අත්සන් තබනු ඇත

- අත්සන් කළ පරිසර ආරක්ෂණ බලපත්‍රය, විෂය භාර නිලධාරී විසින් පෙරටු කාර්යාලයට යොමු කෙරේ

- අත්සන් කළ පරිසර ආරක්ෂණ බලපත්‍රය ඉල්ලුම්කරුට තැපෑලෙන් යොමු කිරීම හෝ රැගෙන යන ලෙසට ඉල්ලුම්කරුට දැන්වීම

## පරිසර ආරක්ෂණ කමිටුව විසින් ඉල්ලීම නිර්දේශ කර නොමැති විට ... ... ...?

- ප්‍රතික්ෂේප කිරීමට බලපාන ලද හේතු ඔබට දැනුම් දෙනු ඇත.

- ප්‍රතික්ෂේප කිරීමට බලපාන ලද හේතු ඉවත් කර, නැවත සලකා බලන ලෙස ඉල්ලා සිටීමට ඔබට හැකියාව ඇත.

- අඩුපාඩු නිවැරදි කර නැවත වාර්තා කළ විට, බලපත්‍රය නිකුත් කිරීමේ දී කලින් අනුගමනය කළ ක්‍රියා පිළිවෙළ නැවත ආරම්භ කරනු ඇත

## පරිසර බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කර ඇති විට - ඔබට කළ හැකි දේ ... ... ...?

- පරිසර බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ බව ඔබට ලිපියක් මගින් දැනුම් දෙනු ලැබේ

- බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ ලිපිය ලැබී දින 30 ක් ඇතුළත පරිසර විෂය භාර අමාත්‍යංශයේ ලේකම් වෙත අභියාචනය කිරීමට ඔබට හැකියාව ඇත

- අභියාචනය තමන් වෙත ලැබී දින හතක් ඇතුළත, ඒ පිළිබඳ තම තීරණය අමාත්‍යංශ ලේකම්වරයා විසින් ඔබට දැනුම් දෙනු ඇත

## ඒ තීරණය කවර ආකාරයේ ද ... ... ...?

## එය අවසාන තීරණය වේ.